රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 14/91 (V)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07,

1992 ජූලි මස 13 වැනි දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දිසාපතිවරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
පළාත් ආණ්ඩුකාර ලේකම්වරුන් සහ
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන් වෙත.

**<u>සහනදායී කොන්දේසි මත වාහන ආනයනය කිරීම.</u>**

1991.05.08 සහ 1991.10.04 දිනයන්හි පිළිවෙලින් නිකුත් කරන ලද අංක. 14/91 සහ 14/91(1) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවලට ඔබේ අවධානය යොමු කරවමි.

02. මෙම ක්‍රමය යටතේ වාහන ආනයනය කළ සමහර පුද්ගලයන් පනවා ඇති කොන්දේසි අයථා ක්‍රම මගින් උල්ලංඝණය කරන අවස්ථා ඇතිවීමට ඉඩ තිබෙන නිසා අදාල බලධාරීන් විසින් පහත සඳහන් ක්‍රියාමාර්ගයන් අනුගමනය කළ යුතු බවට රජය දැන් තීරණය කර තිබේ.

I. උගස්කරය අත්සන් කළ වහාම එදින සිට වසර 5 ක් ගතවන තුරු වාහනය රජයට උගස්කර ඇති බවට සටහනක් ඇතුළත් කිරීම සඳහා වාහනවල ලියාපදිංචි කිරීමේ ලේඛණ අදාල අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් මෝටර් රථ රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතුය. වාහනය ලියාපදිංචි කිරීමේ ලේඛණයේ අදාල සටහන කළ පසුව එම ලේඛණයේ පිටපතක් වාහනය අයිතිකරුට නිකුත් කර මුල් පිටපත අදාල අමාත්‍යාංශයේ ලේකම් වෙත ආපසු යැවීමට මෝටර් රථ රෙජිස්ට්‍රාර් විසින් කටයුතු කළ යුතුය. උගස්කරයේ වලංගු කාලය අවසන් වන තුරු වාහන ලියාපදිංචි කිරීමේ ලේඛණයේ මුල් පිටපත අදාල අමාත්‍යාංශයේ ලේකම්වරයා භාරයේ තබාගත යුතුය. දැනටමත් ආනයනය කර ඇති වාහන සම්බන්ධයෙන් ද මෙම අවශ්‍යතාවය අදාල වන්නේය.

II. සහනදායී කොන්දේසි යටතේ වාහන ආනයනය කරන ලද පුද්ගලයන්ට වසර 05 ක කාලයක් සඳහා රාජකාරී වාහන ලබා නොදීමට අදාල අමාත්‍යාංශ ලේකම්වරුන් වග බලා ගත යුතුය.

III මෙම ක්‍රමය යටතේ ආනයනය කරන ලද වාහන ඒවා ආනයනය කරන ලද පුද්ගලයන් විසින් පාවිච්චි කරන්නේ ද, නැත්නම් ඒවා ඔවුන්ගේ සන්තකයේ තිබේ ද යන්න ගැන පොලීසිය රේගු බලධාරීන් හා මෝටර් රථ රෙජිස්ට්‍රාර් සුපරීක්ෂාකාරී වනු ඇත. වාහනය ආනයනය කරන ලද තැනැත්තා නොවන වෙනත් කෙනෙකු එය පාවිච්චි කරන බව හෝ වෙනත් අයෙකුගේ සන්තකයේ පවත්නා බව සොයා ගනු ලැබුවහොත්, රේගු ආඥා පණතේ විධිවිධාන යටතේ දැඩි ක්‍රියාමාර්ගයක් ගනු ලබනු ඇත.

IV. වාහනයක් ආනයනය කරන ලද තැනැත්තෙකු වසර **5** ක් ගතවීමට පෙර සේවයෙන් ඉල්ලා අස් වුවහොත් හෝ දරුණ තනතුර අත්හැර ගියහොත් හෝ සේවයෙන් පහකරනු ලැබුවහොත් හෝ ඔහුගේ සේවය අවසන් කරනු ලැබුවහොත් වාහනය ආනයනය කරන ලද අවස්ථාවේ දී කපා හරින ලද තීරුබදු, ගාස්තු ආදිය අනුපාතික ක්‍රමයට ඔහුගෙන් අයකර ගැනීම අදාල අමාත්‍යාංශයේ ලේකම් විසින් කළ යුතුය. එසේ අය කළ යුතු බදු, ගාස්තු ආදිය තීරණය කිරීමේ දී රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස් ලබාගත යුතුය.

V. සහනදායී කොන්දේසි මත වාහනයක් ආනයනය කළ නිලධාරියෙකුගේ වාහනය තබන ස්ථානයේ ලිපිනය වෙනස්වන අවස්ථාවල දී එවැනි වෙනස්වීමක් සිදු වූ දින සිට සතියක් ඇතුළත ඒ බව මෝටර් රථ රෙජිස්ට්‍රාර්, භාණ්ඩාගාරයේ ලේකම්, රේගු අධ්‍යක්ෂ ජනරාල් හා අදාල අමාත්‍යාංශයේ ලේකම් වෙත දැන්විය යුතුය.

VI. මෙම ක්‍රමය යටතේ ආනයනය කරනු ලබන වාහන සම්බන්ධව ණයවර ලිපි විවෘත කළ යුත්තේ ආනයන බලපත්‍ර හිමියාගේ නමින් පමණකි.

VII. කපා හරිනු ලබන රේගු ගාස්තු සඳහා වන නිර්දේශයන් අත්සන් කළ යුත්තේ අමාත්‍ය මණ්ඩල අමාත්‍යවරයෙකුගේ අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් හෝ ඔවුන් විසින් පෞද්ගලිකව බලය පවරන ලද ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්ගේ තනතුරට නොඅඩු තත්ත්වයක නිලධාරියෙකු විසින් පමණක් විය යුතුය. පළාත් සභාවල නිලධාරීන් සම්බන්ධයෙන් රේගු ගාස්තු කපා හැරීමේ නිර්දේශ පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන් විසින් පෞද්ගලිකවම අත්සන් කළ යුතුය. රේගු ගාස්තු කපා හැරීම සඳහා නිර්දේශයන් කිරීමට බලය දුන් නිලධාරීන්ගේ ආදර්ශ අත්සන් අදල අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් පෞද්ගලිකවම සහතික කොට භාණ්ඩාගාරයේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

**03**. බැඳුම්කරයේ සහ ප්‍රතිශෝධිත ගිවිසුම්පත් ආදර්ශ පිටපත් අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ එවමි. මෙම ක්‍රමය යටතේ ආනයනය කරන ලද සෑම වාහනයක් වෙනුවෙන්ම ගිවිසුම් හා උගස් බැඳුම්කරයන් අත්සන් කරනු ලබන බවට අදල අමාත්‍යාංශ ලේකම්වරුන් වග බලාගත යුතුය. අදල රේගු ගාස්තු කපා හැරීමේ නිර්දේශයන් භාණ්ඩාගාරයේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට පෙර ගිවිසුම් අත්සන් කරවා ගත යුතු බව ද, වාහනය රේගු දෙපාර්තමේන්තුවෙන් නිෂ්කාශනය කර දින **30** ක් ඇතුළත උගස් බැඳුම්කරය අත්සන් කළයුතු බව ද කරුණාකර සටහන් කරගන්න.

අ.කලේ/ එම්.එන්.ජුනයිඩ්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

14/91 (V)

**<u>මෝටර් වාහනයක් වෙනුවෙන් තීරුබදු සහන ප්‍රදානය කිරීම</u>**
**<u>සඳහා වන ගිවිසුම් පත්‍රය.</u>**

.......................................................................................................................හි පදිංචි (මෙහි මින්මතු
(ලිපිනය)

" නිලධාරියා / සේවකයා " යනුවෙන් හඳුන්වනු ලබන හා යොමු කරනු ලබන ) ..........................
'.......................................................................................................................එක් පක්ෂයට ද,
(සම්පූර්න නම )

(මෙහි මින්මතු සඳහන් කෙරෙන හා යොමු කෙරෙන " ලේකම් " ) යන පාඨයට හෝ

ප්‍රකාශයට එය මෙහි පාවිච්චි කර ඇති පරිදි සහ පදගත සම්බන්ධය අනුව අවශ්‍ය කරන

හා පිළිගැනෙන පරිදි පහත සඳහන් ........................................................අමාත්‍යාංශයේ

ලේකම් වශයෙන් ක්‍රියා කරන පහත නම් සඳහන් ..........................................................

(සම්පූර්ණ නම)

සහ අදල අවස්ථාවේ දී එම තනතුරේ නියුක්තව සිටින අනුප්‍රාප්තිකයන් ද, අදල අවස්ථාවේ දී

එම තනතුරෙහි වැඩ බලන්නා වූ හෝ...........................................................................................
.
අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් දනට ඉටු කරන කාර්යයන් ඉටු කරන්නා වූ පුද්ගලයන් ද,

අදහස් කෙරෙන හා ඇතුළත්වන පරිදි එකී " ලේකම් " යන පාඨයෙන් මෙහි මින්මතු

සඳහන් කෙරෙන්නා වූ ද, ( මින්මතු " රජය " යනුවෙන් සඳහන් කරනු ලබන හා යොමු කරනු

ලබන ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සඳහා සහ වෙනුවෙන් ක්‍රියා කරන

..........................................................................................අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් සිටින

එකී .......................................................අනෙක් පක්ෂයටද පෙනී

( සම්පූර්ණ නම )

සිටිමින් අප දෙපක්ෂය අතරේ ගිවිසගෙන අත්සන් කරනු ලබන ගිවිසුමයි.

(අ) නිලධාරියා / සේවකයා ......................................හි......................................

................................වශයෙන් දනට ක්‍රියා කරන අධිකරණ

නිලධාරියෙකු / රජයේ සේවකයෙකු / සංස්ථා සේවකයෙකු වන බැවින් ද,

(ආ) මෙහි උපලේඛණනයෙහි දක්වා ඇති විස්තරවලට අදල වාහනය ආනයනය කිරීමේ දී එම වාහනයේ මිල ආරක්ෂණ සහ ප්‍රවාහන වටිනාකමින් 25% ක් නිලධාරියා / සේවකයා විසින් රජයට ගෙවනු ලැබීමට යටත්ව ගෙවිය යුතුවන සම්පූර්ණ තීරුබදුවල සහ බදුවල මුළු ගණනට සමාන මුදල වන රුපියල් ................................................ මුදලක අනුග්‍රහයක් නිලධාරියාට / සේවකයාට ප්‍රදනය කිරීමට රජය එකඟ වී ඇති බැවින් ද,

(ඇ) එසේම පූර්වෝක්ත අනුග්‍රහය සහිතව ආනයනය කරනු ලබන ( මෙහි මින්මතු වාහනය යනුවෙන් සඳහන් කරනු ලබන ) මෝටර් වාහනය මෙහි පහත දෙපක්ෂය විසින් ම එකඟවනු ලබන නියමයන්ට හා කොන්දේසිවලට අනුකූලව පාවිච්චි කිරීමට නිලධාරියා / සේවකයා එකඟ වී ඇති බැවින් ද. එකී නිලධාරියා / සේවකයා සහ ලේකම් දන් මෙහි දී අන්‍යොන්‍ය වශයෙන් පහත සඳහන් ප්‍රකාර ගිවිස ගනු ලැබේ.

I. එකී වාහනය සම්බන්ධයෙන් ගෙවිය යුතු මුළු රේගු තීරුබදු හා බදු ප්‍රමාණය රුපියල් .............................කි. ( රු. ............................)

II. එකී වාහනය නිලධාරියා / සේවකයා විසින් ආනයනය කළ යුතුය.

III. එකී වාහනය ආනයනය කිරීම සම්බන්ධයෙන් වාහනයේ මිල ආරක්ෂණ සහ ප්‍රවාහන වටිනාකමින් 25% ක් රජයට ගෙවනු ලැබීමට යටත්ව, සම්පූර්ණ රේගු තීරුබදු හා බදු ආදියට සමාන රුපියල්..........................................(රු............................) අනුග්‍රහ මුදලක් රජය විසින් නිලධාරියාට ප්‍රදනය කළ යුතුය.

IV. නිලධාරියා විසින් ගාස්තුවක් වශයෙන් එකී වාහනයේ මි.ර.ප්‍ර.වටිනාකමින් 25% ක් වන රුපියල්...................................... (රු....................) මුදලක් රජයට ගෙවිය යුතුය.

V. නිලධාරියා / සේවකයා එකී මෝටර් වාහනය ප්‍රවේශමෙන් පාවිච්චි කළයුතු අතර, එය මනා ලෙස හා නිසි පරිදි අළුත්වැඩියා කර ධාවන තත්ත්වයේ පවත්වා ගත යුතුය.

VI. නිලධාරියා / සේවකයා එකී මෝටර් වාහනය හා එහි අන්තර්ගත සෑම කොටසක් කෙරෙහිම ආරක්ෂාව පිළිබඳ වගකිවයුතු අතර, එකී රථයේ සම්පූර්ණ ආරක්ෂාව සැලසෙන බවට සහතික වීම සඳහා සෑම පියවරක්ම ගත යුතුය.

VII. නිලධාරියා / සේවකයා විසින් පූර්වෝක්ත මෝටර් වාහනය කවරාකාරයක හේතුවක් නිසාවත්, භාණ්ඩාගාරයේ ලේකම්ගේ පූර්ව අනුමතිය නොමැතිව අනමාරුවට දීම, බද්දට දීම, විකිණීම, ඔඩපනය කිරීම, භාරදීම, හුවමාරු කිරීම හෝ එකී මෝටර් වාහනය කවරාකාරයේ කවර හෝ පුද්ගලයෙකුට බැහැර කිරීම හෝ එහි සන්තකයෙන් වෙන්වීම හෝ නොකළ යුතුය. මෙම කොන්දේසිය කවර ආකාරයකින් හෝ උල්ලංඝනය කිරීමක් සිදු වුවහොත් එකී මෝටර් වාහනය. රේගු ආඥා පනතේ විධිවිධාන යටතේ රාජසන්තක කිරීමට යටත් වේ.

VIII. පූර්වෝක්ත මෝටර් රථය කවර හෝ අනතුරකට භාජනයවීමේ දී හෝ අනතුරකට මැදිහත්වීමේ දී හෝ රථයට හානි සිදුවීමේ දී හෝ රථය විනාශවීමේ දී හෝ රථය නැතිවීමේ දී හෝ නිලධාරියා / සේවකයා වහාම ඒ බව අදාල පොලිස් ස්ථානයට හා ලේකම්ට දැනුම් දිය යුතුය.

IX. නිලධාරියා / සේවකයා විසින් මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබා නොගෙන පූර්වෝක්ත වාහනයේ හිමිකම්, එකී වාහනය මිළදී ලබාගත් දින සිට ක්‍රියාත්මක වන පරිදි වූ පස් අවුරුදු කාල පරච්ඡේදය තුළ කවර හෝ වෙනත් පුද්ගලයෙකුට පැවරීම නොකළ යුතුය. එසේ පවරනු ලැබූ අවස්ථාවක් වුවොත් නිලධාරියා / සේවකයා විසින් තමාට ප්‍රදානය කරන ලද අනුග්‍රහය වෙනුවට රුපියල් .....................................(රු. ............................) මුදලක් රජයට ගෙවිය යුතුය. මෙම කොන්දේසිය කවර ලෙසකින් හෝ උල්ලංගණය කළහොත් පූර්වෝකත වාහනය රාජසන්තක කිරීමට යටත් වේ.

X. මෙම ගිවිසුමේ අඩංගුවන විධිවිධාන විධිවූ පරිදි පිළිපදින බවටත්, මෙම ගිවිසුමේ විධිවිධාන යටතේ රජයට ලබා ගැනීමට හිමිකම් ඇති සියලුම මුදල් විධිවූ පරිදි ගෙවන බවටත් ඇපයක් වශයෙන් වාහනය ආනයනය කරන අවස්ථාවේ දී අත්හරින ලද තීරුබදු හා සෙසු බදුවල වටිනාකම වන රුපියල් ................................(රු.................) මුදලකට

වාහනය රේගු දෙපාර්තමේන්තුවෙන් නිෂ්කාශනය කරගත් දින සිට දින තිහක් ( 30 ක්) ඇතුලත දී එම නිලධාරියා / සේවකයා විසින් එකී වාහනය අවුරුදු පහක (5) කාලයක් සඳහා රජයේ නමින් උකස් කළ යුතුය.

XI. ඉහත සඳහන් කර ඇති අවුරුදු පහක කාලපරිච්ජේදය තුළ වාහනය සඳහා දෙන ලද තීරු බද්දට හා බදු අනුග්‍රහයට නොඅඩු මුදලකට නිලධාරියා / සේවකයා විසින් පූර්ණ රක්ෂණ ආවරණයක් ලබාගත යුතුය.

XII. මෙකී අනුග්‍රාහත්මක නියමයන් මත වාහනයක් මිලට ගනු ලබන නිලධාරියාට / සේවකයාට එකී වාහනය මිලට ගත් දින සිට අවුරුදු පහක (5) කාලපරිච්ජේදයක් ගතවන තෙක් නිල වාහන දෙනු නොලැබේ.

XIII. නිලධාරියා / සේවකයා වාහනය ආනයනය කළ දින සිට අවුරුදු 05 ක කාලපරිච්ජේදයක් ගතවන තෙක් නිල වාහන පාවිච්චි නොකළ යුතුය.

XIV. වාහනය ආනයනය කළ දින සිට ආරම්භවන පස් අවුරුද්දක කාල පරිච්ජේදය අවසන්වීමට ප්‍රථම නිලධාරියා / සේවකයා සිය තනතුරෙන් ඉල්ලා අස්වීමේ දී හෝ සිය තනතුර අතහැර යාමේ දී හෝ සිය තනතුරෙන් පහ කරනු ලැබීමේ දී හෝ වාහනය ආනයනය කරන අවස්ථාවේ දී අත්හරින ලද තීරු බදු හා සෙසු බදුවල වටිනාකම ඔහු / ඇය විසින් සමානුපාතික පදනමක් මත ලේකම්ට ගෙවිය යුතුය.

XV. මෝටර් වාහනය තබා ඇති ස්ථානයේ ලිපිනය වෙනස්වන විට, ඒ බව, එකී වෙනස් කිරීමේ දින සිට සතියක් ඇතුලත මෝටර් වාහන රෙජිස්ට්‍රාර් භාණ්ඩාගාරයේ ලේකම්, රේගු අධ්‍යක්ෂ ජනරාල් සහ ලේකම් වෙත දැනුම් දිය යුතුය.

14/91 (V)

**ඉහත සඳහන් උපලේඛණය මෙසේය.**

( මෝටර් වාහනයේ විස්තරය)

මෝටර් වාහනය :-........................................................................................................

(අ) වර්ගය සහ මාදිලිය :-

(ආ) බොඩියේ ආකාරය:-

(ඇ) එන්ජින් අංකය :-

(ඈ) චැසි අංකය :-

(ඉ) ලියාපදිංචි අංකය :-

(ඊ) ඇතුලත් කර ඇති අමතර උපාංග :-

(උ) උපකරණ හා අතිරේක කොටස් :-

මෙකී ගිවිසුමට සාක්ෂි වශයෙන්, නිලධාරියා / සේවකයා ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සඳහා සහ ඒ වෙනුවෙන් මෙහිලා ක්‍රියා කරන ලේකම් ද වර්ෂ එක්වා දහස් නවසිය අනූ....................ක් වූ.............................මස...........................වැනිද වන මෙදින මෙකී ලේඛණයට සහ මේ ආකාරයේම සහ මේ දතමින්ම යුක්ත වූ තවත් පිටපත් දෙකකට පිළිවෙලින් කොළඹ දී සිය අත්සන් තබන්නට යෙදුනා ඇත.

................................................

නිලධාරියා / සේවකයා.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
සඳහා සහ ඒ වෙනුවෙන්.

................................................

ලේකම්.

..........................................අමාත්‍යාංශය.

සාක්ෂි :-

1. අත්සන :-
නම :-
තනතුර :-
ලිපිනය :-

2. අත්සන :-
නම :-
තනතුර :-
ලිපිනය :-

14/91 (V)

# උකස් බැඳුම්කරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ........................................................හි පදිංචි ..............................................................මහතා/ මහත්මිය/ මෙනෙවිය ( ඔහු / ඇය ) මෙහි මින්මතු සඳහන් කෙරෙන " බන්ධනදයී " යන පාඨයට හෝ ප්‍රකාශයට එය මෙහි පාවිච්චි කර ඇති පරිදි සහ පදගත සම්බන්ධය අනුව අවශ්‍ය කරන හා පිළිගැනෙන පරිදි හා ඇතුළත් වන පරිදි එකී..........................................හා ඔහුගේ / ඇගේ උරුමක්කාරයින් පොල්මංකාරයින් සහ අද්මිනිස්ත්‍රාසිකරුවන් අදහස් කරනු ලැබේ.) ශුභාසිංසන පූර්වකව සියළු දෙනා වෙත මෙයින් දන්වා සිටින වග නම්,

බන්ධනදායියා සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය ( මෙය මෙහි මින්මතු " බන්ධනලාභියා " යනුවෙන් සඳහන් කෙරෙන අතර එම " බන්ධනලාභියා " යන පාඨයට හෝ ප්‍රකාශයට එය මෙහි පාවිච්චි කර ඇති පරිදි සහ පදගත සම්බන්ධය අනුව අවශ්‍ය කරන හා පිළිගැනෙන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා රට අයත් පැවරුම් අදහස් වේ.) අතර අත්සන් කරනු ලබන .....................................................දාතම දරණ ගිවිසුම ප්‍රකාර, මෙකී උපලේඛණයේ සවිස්තරව සඳහන් කර ඇති පරිදි, මෝටර් වාහනය ( මෙහි මින්මතු ' එකී වාහනය ' යනුවෙන් සඳන් කෙරෙන ) ආනයන කිරීම සම්බන්ධයෙන් බන්ධනලාභියාට ගෙවීමට නියමිත සියළුම තීරුබදු සහ බදු ඇතුලත් මුළු මුදල වන රුපියල් ...................................(රු............................) ක් වූ මුදල ලිහිල් කිරීමක් ලබාගෙන ඇති අතර පූර්වෝක්ත ..........................................වාහනය මිළට ගත් දින එනම් .....................................දින සිට අවුරුදු පහක ( 5) කාල පරිච්ඡේදයක් ඉකුත්වීමට මත්තෙන් එකී වාහනය බන්ධනලාභියා විසින් විකුණනු ලැබුවහොත් එකී මුදල වන රුපියල්.............................. .....( රු...........................) ගෙවන බවට ඇපයක් වශයෙන් එකී මෝටර් වාහනය බන්ධනලාභියාට උකස් කිරීමට හා යටත් කොට බැඳ තැබීමට ගිවිස ගත්තා ළදී.

දැන් මේ ගිවිසුමෙන් සියළුදෙනා විසින්ම දැනගත යුතු වගනම් බන්ධනදයියා විසින් ඉහත සඳහන් හේතු සාධක සැලකිල්ලට ගෙන මෙහි උපලේඛණයේ සම්පූර්ණයෙන් විස්තර කර ඇති පූර්වෝක්ත වාහනය එබඳු ගෙවීමක් සඳහා ඇපයක් වශයෙන් සියළුම තහනම්වලින් ගාස්තුවලින් කැප අයිතිකම්වලින් සහ මුදල් අවහිරතාවලින් තොරව මුල් උකසක් වශයෙන් බන්ධනලාභියා වෙත විශේෂයෙන් උකස් කොට ඔහුට යටත් කොට බැඳ තබන ලද බවය. තව ද, බන්ධනදයියා බන්ධනලාභියා සමඟ පහත සඳහන් ප්‍රකාර වගකීමට මෙසේ ගිවිස ගනී.

1. මෙම බැඳුම්කරය වලංගු කාලය තුළ දී, බන්ධනදයියා විසින් එකී මෝටර් වාහනය අතමරුවට දීම. කුලියටදීම, ඔඩපන කිරීම, බැහැර දීම, හුවමාරු කිරීම නොඑසේ නම් විකුණා දැමීම හෝ හිමිකමෙන් ඉවත්වීම හෝ නොකළ යුතුය.

2. එකී බන්ධනදයියා, පූර්වෝක්ත වාහනය සඳහා නීතියෙන් ගෙවීමට බැඳී ඇති සියළුම බලපත්‍ර ගාස්තු කලට වේලාවට පැහැර හැරීමෙන් තොරව ගෙවා නිමකර එකී වාහනය සම්බන්ධයෙන් ගින්නෙන් හා කැරැලිවලින් පැමිණෙන අන්තරාය වලින් ආරක්‍ෂාව සැලසෙන ආවරණය ද ඇතුළුව එකී වාහන සඳහා දෙනු ලබන තීරුබදු හා බදු අනුග්‍රහය වශයෙන් රුපියල් ........................................(රු....................... ............) වන එකී මුදලට නොඅඩු මුදලකට ශ්‍රී ලංකා රක්‍ෂණ සංස්ථාවෙන් හෝ වෙනත් කවර පිළිගත් රක්‍ෂණ ආයතනයකින් හෝ සර්වග්‍රාහී රක්‍ෂණ ආවරණයක් ලබා ගැනීමේ වගකීමට බැඳී එසේ කරන බවට ප්‍රකාශ කරමින් ද, එකී වාහනයට සිදු වූ කවර හෝ හානියක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රක්‍ෂණ සංස්ථාව විසින් හෝ වෙනත් කවර පිළිගත් රක්‍ෂණ ආයතනයක් විසින් හෝ ගෙවන ලද සියළුම මුදල් එකී වාහනයේ අළුත්වැඩියා කිරීම් සඳහාම බන්ධනදයියා විසින් උපයෝගී කරගන්නා බවට ද, කෙසේ වෙතත්, එකී මෝටර් වාහනය විනාශ වී යාම හෝ අළුත්වැඩියා කළ නොහැකි අන්දමින්සම්පූර්ණ අබලන් තත්ත්වයට පත් වුවහොත් ශ්‍රී ලංකා රක්‍ෂණ සංස්ථාවෙන් හෝ වෙනත් කවර පිළිගත් රක්‍ෂණ ආයතනයකින් හෝ ලත් මුදල මෙම බැඳුම්කරයෙන් සම්පූර්ණයෙන් නිදහස්වීම් වශයෙන් බන්ධනලාභියාට ගෙවිය යුතු බවට ද තවදුරටත් වගකීමට බැඳෙමින් එකඟවනු ලබන බවට ද මෙයින් ප්‍රකාශ කර සිටිනු ලැබේ.

**3.** එකී වාහනය ආනයනය කළ දින එනම්, ......................................සිට අවුරුදු පහක (5) කාල පරිච්ඡේදයක් තුළ දී එකී මුදල වන රුපියල් ......................................... (රු......................................) ගෙවා ඇති බවට සාක්ෂි නොමැතිව මෝටර් රථ වාහන රෙජිස්ට්‍රාර් විසින් එකී වාහනය වෙනත් පුද්ගලයෙකුට පැවරීම නොකළ යුතුය.

4. වාහනය ආනයනය කළ දින සිට ආරම්භ වන පස් අවුරුදු කාල පරිච්ඡේදය අවසන්වීමට ප්‍රථම බන්ධනදයියා සිය තනතුරෙන් ඉල්ලා අස්වීමේ දී හෝ සිය තනතුර අතහැර යාමේ දී හෝ සිය තනතුරෙන් පහ කරනු ලැබීමේ දී හෝ වාහනය ආනයනය කරන අවස්ථාවේ දී අත්හරින ලද තීරු බදු හා සෙසු බදුවල වටිනාකම බන්ධනදයියා විසින් බන්ධනලාභියා වෙනුවෙන් සමානුපාතික පදනමක් මත ගෙවිය යුතුය.

05. පූර්වෝක්ත වාහනය බන්ධනලාභියාගේ නමින් උකස් කර තිබෙන බවට යෝග්‍ය සහතික සටහනක් මෝටර් රථ වාහන රෙජිස්ට්‍රාරි විසින් නිකුත් කරන ලද ලියාපදිංචි පොතෙහි ලියා තිබිය යුතුය.

මෙම උකස් බැඳුම්කරයට සාක්ෂි වශයෙන් බන්ධනදායියා වර්ෂ එක්වා දහස් නවසිය අනූ..............................ක් වූ ..............................මස...................වැනිද වන මෙදින මෙකී ලේඛණයට සහ මේ ආකාරයෙන්ම සහ මේ දතමින්ම යුක්ත වූ තවත් පිටපත්.................................කොළඹ දී සිය අත්සන් තබන්ට යෙදුනා ඇත.

**ඉහත සඳහන් වූ උපලේඛණය.**

මෝටර් වාහනය.......................................................................................................

(අ) වර්ගය හා මාදිලිය -
(ආ) බොඩියේ ආකාරය-
(ඇ) එන්ජින් අංකය -
(ඈ) චැසි අංකය -
(ඉ) ලියාපදිංචි අංකය -
(ඊ) ඇතුළත් කර ඇති අමතර උපාංග -
(උ) උපකරණ හා අතිරේක කොටස් -

බන්ධනදායියාගේ අත්සන.

**සාක්ෂි:**

1. අත්සන :
නම :
ලිපිනය :

2. අත්සන :
නම :
ලිපිනය :